රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
பொது கடன் மேலாண்மை அலுவலகம்
Public Debt Management Office

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යංශය,
මහ ලේකම් කාර්යාලය (3 වැනි මහල), කොළඹ 001000, ශ්‍රී ලංකාව

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி)இ கொழும்பு 00100இ இலங்கை

Ministry of Finance, Planning and Economic Development
The Secretariat (3rd Floor), Colombo 00100, Sri Lanka

| | |
|---|---|
| නිකුත් කළේ | රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය |
| දිනය | 2026 සැප්තැම්බර් 11 |

# මාධ්‍ය නිවේදනය

## 2026 සැප්තැම්බර් 11 වැනි දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව

| කාණ්ඩය | 10.00%2030 'A' | 11.70%2034 'A' | 10.75%2037 'A' |
|---|---|---|---|
| කල්පිරෙන දිනය | 2030 අගෝස්තු 01 වැනි දින | 2034 ඔක්තෝම්බර් 15 වැනි දින | 2037 ජුලි 01 වැනි දින |
| සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර (සු.හ.ජා.) අංකය (ISIN) | LKB00530H016 | LKB00934J156 | LKB01237G019 |
| කූපන් පොලී අනුපාතිකය (වාර්ෂික) (%) | 10.00 | 11.70 | 10.75 |
| වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණය (රු.මිලියන) | 70,000 | 50,000 | 30,000 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු.මිලියන) | 107,603 | 116,146 | 86,198 |
| පිළිගත් ලංසු ප්‍රමාණය(රු.මිලියන) | 70,000 | 50,000 | 30,000 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | 10.83 | 11.96 | 12.08 |

**ගෙවීම් කළ යුතු දිනය 2026 සැප්තැම්බර් 15 වේ.**

LKB00530H016, LKB00934J156 සහ LKB01237G019 යන සු.හ.ජා. අංක සඳහා, ගෙවීම් කළ යුතු දිනයට පෙර ව්‍යාපාරික දිනයේ ප.ව. 3.00 දක්වා (එනම්, 2026.09.14) නිකුතු කවුළුවක් විවෘතව පවතින අතර, මෙම නිකුතුව එකී සු.හ.ජා. අංක සඳහා වෙන්දේසියේදී තීරණය කරන ලද බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික අනුව, පිරිනමන ලද අදාල සු.හ.ජා. අංකවලින් 10% ක ප්‍රමාණයක් සඳහා ලබා දෙනු ඇත. නිකුතු කවුළුව තුළින් අනුමත කළ ප්‍රමාණය අභිබවා ලංසු ලැබුනහොත් පළමු අදියර තුළදී අදාළ සු.හ.ජා. අංකය සඳහා වෙන්දේසියට සහභාගී වූ පාර්ශවයන්ගේ සාර්ථකත්වයට සමානුපාතිකව වෙන් කිරීම් සිදු කරනු ඇත.

ප්‍රාථමික වෙන්දේසියේදී ලංසුවක් සඳහා අවශ්‍ය වන අවම මුදල, නිකුතු කවුළුව සඳහා ද අදාළ වේ.